**ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජනවාරි 09 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,038.99 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,002.66 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 36.33 ක් හෙවත් සියයට 3.5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 873.49 | 872.15 | 1.34 | 0.15 |
| මූලධන | 165.50 | 130.51 | 34.99 | 21.10 |
| එකතුව | 1,038.99 | 1,002.66 | 36.33 | 3.50 |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත මධ්‍යම සංස්කෘතික අරමුදලින් එකතුව රු. මිලියන 115.07 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 19.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 95.39 ක් හෙවත් සියයට 83 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 20701 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 55.00 | 41.17 | 31.00 | 36.39 | 160.00 | 98.19 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0150/0016/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය 2016 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1.02 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුවේ යටතේ තැන්පත් ගිණුම් දෙකක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 178.79 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0013/119/000 | 177.33 |
| 6000/0000/00/0016/109/000 | 1.46 |
| එකතුව | 178.79 |

## 2.5 විගණන නිරීක්ෂණය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් චෙක්පත් භාරදීමේ ලේඛනය නිසි පරිදි පවත්වා නොතිබුණු අතර, තොග ලේඛනය විධිමත්ව හා යාවත්කාලීන කර නොතිබුණි.

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පුරාවිද්‍යා පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අවුරුදු සියයකට නොඅඩු කාල පරිච්ඡේදයක් පැවති තිබෙන හෝ පැවති තිබෙන්නේ යයි විශ්වාස කරනු ලබන පුරාවිද්‍යා ස්ථාන ලෙස හඳුනාගෙන ඇති රජමහා විහාර 700 කට අධික ප්‍රමාණයක් හා පුරාණ විහාර 600 කට ආසන්න ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ දැනට දක්නට ලැබෙන බව වාර්තා වී තිබුණි. මෙම විහාරස්ථාන අතරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් දැනට පුරාවිද්‍යා ස්ථාන ලෙස ගැසට් කර ඇති රජමහා විහාර සහ පුරාණ විහාරවල නම් සහ ලිපිනයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. උදා-:

කුරුණෑගල,ධම්මපාල මාවතේ පිහිටි නාගොල්ල රජමහා විහාරයේ තිබූ රන් ආලේපිත හිටි පිළිම වහන්සේ සහ හිදි පිළිම වහන්සේ.

**3.3 විසර්ජන ගිණුම**

----------------

**3.3.1 අයවැය විචලනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මූලධන වැය විෂයයන් 5 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------------------------------

මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 2 දිනැති අංක 11/0169/555/004 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාර පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා වූ පුරාවිද්‍යා උරුම කළමනාකරණ අරමුදල සඳහා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් තැන්පත් ගිණුම් අංකයක් ලබාගෙන නොතිබුණි. එබැවින් විධිමත් ක්‍රමවේදයකින් තොරව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් සෘජුවම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට විවිධ කාර්යයන් සඳහා නිදහස් කරනු ලබන මුදල් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි.

(ආ) පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් මෙන්ම වෙනත් පෞද්ගලික හා රාජ්‍ය ආයතන මගින්ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන බැංකු ගිණුමටම බැර වන මුදල් වෙන වෙනම සැසඳිය හැකි ආකාරයේ විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂය තුළ දී මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් රු.මිලියන 115.07 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ අතර 2016 වර්ෂය අවසන් වන විට සියලුම ව්‍යාපෘතින්හි වැඩ අවසන් කර මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට 100 ක මට්ටමකට ගෙන ඒම සඳහා කටයුතු කළ යුතු බව ලිඛිතව දන්වා තිබුණි. එහෙත් 2016 වර්ෂය අවසන් වන විට එම මුදලින් රු. මිලියන 19.79 ක් පමණක් වැය කර තිබීම හේතුවෙන් එහි මූල්‍ය ප්‍රගතිය සියයට 17 ක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට 50 ට අඩු මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය.

**3.4 අග්‍රිම ගිණුම**

2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පරිගණක සටහන අනුව අග්‍රිම ශේෂය රු.1,017,426 ක් වූ අතර දෙපාර්තමේන්තු පොත් අනුව එය රු.188,348 කි. මේ අනුව රු.829,078 ක වෙනසක් නිරීක්ෂණය විය.

**3.5 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ රු.507,332 ක්වූ තැන්පතු 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.6 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 20701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය හා මියගිය නිලධාරින්ගේ අයවිය යුතු ණය ශේෂය රු. 1,335,171 ක් වූ අතර ඉන් රු. 125,844 ක් වසර 15 ක කාලයක සිට පැවත එමින් තිබුණි. වසර 1 ත් 3 ත් අතර නොපිය වූ ණය ශේෂ වටිනාකම රු.343,082 ක් වූ අතර මෙම ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.1, 4:2:2, 4:2:3 හා 4:3 වගන්තියට අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.18.1 වගන්තියට අනුව කටයුතු නොකිරීම නිසා 2005 වර්ෂයේ විදේශගත නිලධාරියෙකුගෙන් රු. 68,301 ක ආපදා ණය ශේෂයන් අයකර ගැනීමට නොහැකිව තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ නිලධාරීන්ගේ අයවිය යුතු ශේෂ එකතුව රු.750,893 ක් වූ අතර ඉන් රු. 358,146 ක් වසර 6 කට වඩා වැඩි කාලයක සිට පැවත එමින් තිබුණි.

**3.7 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.7.1 අභ්‍යන්තර විගණනය**

2016 සැප්තැම්බර් 14 දින සිට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණු බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් ද සිදු කර නොතිබුණි.

**3.7.2 විගණන හා කළමනාකරණ කමිටුව**

2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් කැඳවා තිබුණු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 3 කට පමණක් දෙපාර්තමේන්තුව සහභාගී වී තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු.මිලියන | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 633 | 0.12 | දෙපාර්තමේන්තුව විසින් පොත් හා ප්‍රකාශන පෞද්ගලික මුද්‍රණාල මගින් මුද්‍රණය කිරීමේදී ඒ සඳහා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රයේ XXXIII පරිච්ඡේදයේ 1.1 හා 1.4 වගන්ති | 89.08 | බාහිර පාර්ශව සමඟ ගිවිසුම් අත්සන්කිරීමට පෙර එකී ගිවිසුමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව නීතිපතිවරයාගෙන් විමසා කටයුතු කළ යුතු වුවත් රජගල ව්‍යාපෘතියෙහි උපදේශන ගාස්තු සම්බන්ධ ගිවිසුම අත්සන් කිරීමට පෙර එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 ඡේදය | 323.89 | රාජ්‍ය අංශයේ භාණ්ඩ වැඩ හා සේවා ප්‍රසම්පාදනය පිණිස ඇස්තමේන්තු සකස් කිරීමේදී ප්‍රසම්පාදනවලට අදාළ සියලු කරුණු සැලකිල්ලට ගෙන හැකිතාක් දුරට නිවැරදි ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීමට සෑම රාජ්‍ය ආයතනයක්ම වගබලා ගත යුතු විය. එහෙත් රජගල ව්‍යාපෘතියේ 2012 වර්ෂයේ ඇස්තමේන්තුව රු.89,082,512 ක් වුවත් එය 2016 දී රු.323,897,542 ක් දක්වා සියයට 263 කින් වැඩිකර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ භාවිතය සඳහා වූ ප්‍රතිපත්ති හා කාර්යය පටිපාටිය<br>------------------------------- | |
| (i) 010203 මග පෙන්වීම | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වෙබ් පිටුව යාවත්කාලීන කර නොතිබුණු බැවින් 2012 දෙසැම්බර් 30 දිනෙන් පසුව ගැසට් කර ඇති පුරාවිද්‍යා ස්මාරක 802 ක් පමණ වෙබ් අඩවියෙ සඳහන් කර නොතිබුණි. |
| (ii) 010405 මඟ පෙන්වීම් | විගණනය සඳහා ඉදිරිපත් කළ පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලේඛනය සිංහල Unicode මඟින් සකස් කර නොතිබුණි. |
| (iii) 010201 මඟ පෙන්වීම් | පුරාවිද්‍යා වෙබ් අඩවියෙන් බාගත කිරීමේදී පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලේඛනය සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි භාෂා තුනෙන්ම පවත්වාගත යුතු නමුත්, පුරාවිද්‍යා වෙබ් පිටුව සිංහල භාෂාවෙන් පමණක් පවත්වාගෙන ගොස් තිබුණි. |
| (iv) 010802 මග පෙන්වීම් | පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලේඛනය සහ පුරාවිද්‍යා රක්ෂිතවල ලේඛන සඳහා රජයේ gov.lk මඟින් සම්බන්ධතාවයක් ලබාදිය යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඉ) 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතේ 33 වගන්තිය | ගැසට් මඟින් ප්‍රකාශයට පත්කළ පුරාවිද්‍යා රක්ෂිතවල ලේඛනයක් පුරාවිද්‍යා වෙබ් අඩවියේ දක්වා නොතිබුණි. |

**3.9 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(i) දඹුල්ල ලෙන් විහාරයේ සංරක්ෂණ ව්‍යාපෘතියේ සිතුවම් සංරක්ෂණය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් 2014 වර්ෂයේදී රු. 3,299,975 ක මුදලක් ලබා දී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු මෙම කාර්යයන් 2016 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රගතිය සියයට 42ක් හා භෞතික ප්‍රගතිය සියයට 83 ක් බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. මේ අනුව ව්‍යාපෘතිය නිම කිරීමේ අසාමාන්‍ය ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ii) මධ්‍යම සංස්කෘතික අරමුදලින් ලබා දුන් ප්‍රතිපාදනවලින් ආරම්භ කරන ලද ව්‍යාපෘති 23 ක 2016 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 50 කට අඩු බව නිරීක්ෂණය විය

**(ආ) ව්‍යාපෘති ආරම්භ නොකිරීම**

දෙපාර්තමේන්තුව වෙත 2016 වර්ෂය තුළදී ප්‍රතිපාදන ලැබී තිබියදීත් රු. 34,502,088 ක් වටිනා ව්‍යාපෘති 28 ක් ආරම්භ කර නොතිබුණි. ඉන් ව්‍යාපෘති 12 ක් පමණක් 2017 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද ව්‍යාපෘති 16 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි.

**3.10 කාර්යසාධනය**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධයෙන් එසේ නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(අ) පුරාවිද්‍යා ස්ථාන 259 ක සීමා මායිම් ලකුණු කර මායිම් කණු යොදා නොමැති බව නිරීක්ෂණය වූ අතර යාපනය දිස්ත්‍රික්කයේ පමණක් එම සංඛ්‍යාව 79 ක් පමණ විය.

(ආ) ලේඛනගත නොකළ පුරාවිද්‍යා ස්ථාන 52 ක් වාර්තා වී තිබුණු අතර ගැසට් නොකළ පුරාවිද්‍යා ස්ථාන 54 ක් පමණ විය.

(ඇ) ගවේෂණය නොකළ පුරාවිද්‍යා ස්ථාන 50 ක ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය වූ අතර අනවසර පදිංචිවීම් නිසා පුරාවිද්‍යා රක්ෂිත හා පුරාවිද්‍යා ස්මාරක 119 ක් හානි වී තිබුණු බව වාර්තා වී තිබුණි. අනවසර වගා කටයුතු , අනවසර ඉදිකිරීම්, අනවසර පදිංචිවීම් ආදිය මේ සඳහා හේතු වී තිබුණි. කෙසේ වෙතත් ඒ එක් එක් අවස්ථාවන්හි නීතිමය ක්‍රියා මාර්ග ගෙන තිබුණි.

(ඈ) පුරාවිද්‍යා ස්ථානවල නිදන් සොරුන් විසින් කරනු ලබන නීති විරෝධී කැණීම් කටයුතු, ගොඩනැගිලි ඉදිකිරීම් සහ ගල්වලවල් පවත්වා ගෙනයාම වැනි කටයුතු වලින් පුරාවිද්‍යා ස්ථාන 92 ක් පමණ විනාශ වී තිබුණ ද එම තත්ත්වය පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් පියවරගෙන නොතිබුණි.

(ඉ) පුරාවිද්‍යා ස්ථාන ලෙස හඳුනා ගෙන ඇති නමුත් රක්ෂිත හා ස්මාරක ලෙස ලියාපදිංචි නොකළ හා මායිම් කණු යොදා නැති පුරාවිද්‍යාත්මක ස්ථාන 186 ක් පමණ අම්පාර දිස්ත්‍රික්කයේ පවතින බව වාර්තා වී තිබුණි. මෙම ස්ථාන රක්ෂිත කණු දමා ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යා ස්ථාන ලෙස ගැසට් කිරීමට ඉලක්ක ගත සැලසුම් සකස් කර නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුව සතුව පවතින කාර්ය මණ්ඩලයෙන් පුරාවිද්‍යා ස්මාරක හා පුරාවිද්‍යා රක්ෂිත ආරක්ෂාවට යෙදවිය හැකි සේවකයන් ප්‍රමාණවත් නොවන බැවින් සිවිල් ආරක්ෂක භටයන් 200 ක් යෙදවීමට තීරණය කර තිබුණද බස්නාහිර පලාත සහ තවත් දිස්ත්‍රික්ක 06 ක් සඳහා 105 දෙනෙක් පමණක් යොදවා තිබුණි.

(උ) විගණනය විසින් යොමු කළ 2016 ඔක්තෝබර් 31 දිනැති තොරතුරු කැඳවුම් ලිපියට අනුව පොළොන්නරුව සහ වව්නියා දිස්ත්‍රික්ක වලට අදාළ පුරාවිද්‍යා භූමි අනවසරයෙන් අත්පත් කරගැනීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් සම්බන්ධ සවිස්තරාත්මක විස්තර පහත දැක්වේ.

| පලාත/දිස්ත්‍රික්කය | සීමා ලකුණු කර මායිම් කණු සිටුවා නොමැති පුරාවිද්‍යා ස්ථාන ප්‍රමාණය | ලේඛනගත කිරීම් නොමැති පුරාවිද්‍යා ස්ථාන ප්‍රමාණය | ගැසට් නොකළ පුරාවිද්‍යා ස්ථාන | ගවේෂණය නොකළ පුරාවිද්‍යා ස්ථාන | අනවසර පදිංචිවීම් වාර්තාවන පුරාවිද්‍යා ස්ථාන | පුරාවිද්‍යා ස්මාරක වලට හානි සිදුවීම | මෙතෙක් ගවේෂණය සිදු කර නැති හඳුනාගත් පුරාවිද්‍යා රක්ෂිත |
|---|---|---|---|---|---|---|---|
| උතුර | | | | | | | |
| යාපනය | 79 | - | 15 | - | 03 | 01 | - |
| කිලිනොච්චිය | 18 | 15 | 15 | 15 | - | - | - |
| මන්නාරම | 18 | - | - | - | 02 | 02 | - |
| නැගෙනහිර | | | | | | | |
| මඩකලපුව | - | 05 | 05 | 05 | - | 05 | - |
| අම්පාර | - | - | - | - | 25 | 22 | 186 |
| උතුරු මැද | | | | | | | |
| අනුරාධපුරය | 38 | - | 03 | - | 04 | 25 | - |
| මධ්‍යම | | | | | | | |
| මහනුවර | 06 | - | - | - | 03 | - | - |
| නුවරඑළිය | 05 | - | - | - | - | - | - |
| මාතලේ | 25 | - | - | 02 | 05 | - | - |
| දකුණ | | | | | | | |
| හම්බන්තොට | 11 | 01 | - | 11 | 06 | 07 | - |
| ගාල්ල | - | - | - | - | 21 | 02 | - |
| මාතර | - | - | - | - | - | 04 | - |
| ඌව | | | | | | | |
| මොණරාගල | 29 | 16 | 16 | 09 | 22 | 09 | - |
| වයඹ | | | | | | | |
| පුත්තලම | 02 | - | - | 02 | 04 | - | - |
| කුරුණෑගල | 10 | - | - | - | 13 | 15 | - |
| සබරගමුව | | | | | | | |
| රත්නපුරය | 18 | - | - | 06 | 11 | - | - |
| එකතුව | 259 | 52 | 54 | 50 | 119 | 92 | 186 |

## 3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### (අ) බැංකු සැසඳුම් පිළියෙල කිරීම

යාපනය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය විසින් 2017 දෙසැම්බර් 31 දින වන විටත් 2014 ජුනි මාසයෙන් පසු බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

(ආ) ගැලපුම් කළ යුතු ශේෂ

-------------------------

දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබූණ බැංකු සැසඳුම් ප්‍රකාශන වල දැක්වුණු ගැලපුම පිළිබඳ විග්‍රහයට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිකුත් කර මාස 6 ක් ඉක්ම වූ චෙක්පත් වල වටිනාකම රු. 2,138,901 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන මාස 6 ක් ඉක්මවූ උපලබ්ධි නොවූ තැන්පතු රු.914,802 පිළිබඳව පරීක්ෂා කර මෙම ශේෂය නිරවුල් කිරීමට 2017 ජුනි 30 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(iii)2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් ගෙවීම් ලෙස රු.1,162,963ක් දක්වා තිබුණද මෙම ශේෂය නිරවුල් කිරීමට 2017 පෙබරවාරි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iv)2016 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් තැන්පතු ලෙස රු.5,856,631ක් දක්වා තිබුණද මෙම ශේෂ පිළිබඳ පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.12 අවිධිමත් ගනුදෙනු**

**-----------------------**

2016 දෙසැම්බර් 31 දින අදාළ කාර්යය සත්‍ය වශයෙන්ම ඉටු නොකළ කොන්ත්‍රාත් වෙනුවෙන්, පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයට පොදු තැන්පත් ගිණුමෙන් රු.මිලියන 1.68 ක් ද රිටිගල පළාත් ඉංජිනේරු කාර්යාලයට හා පෞද්ගලික සැපයුම්කරුවෙකුට වැය ශීර්ෂයෙන් රු.මිලියන 11.83 ක් වටිනා චෙක්පත් 3 ක් ද ලියා ඒවායේ වටිනාකම් සාවද්‍ය ලෙස විසර්ජන ගිණුමේ සහ පොදු තැන්පත් ගිණුමේ වියදම් ලෙස වාර්තා කර ඇති බව නිරීක්ෂණය විය.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 10 | 43 |
| (ආ) තෘතියික මට්ටම | 56 | 35 | 21 |
| (ඇ) ද්විතියික මට්ටම | 812 | 466 | 346 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 1555 | 1345 | 210 |
| එකතුව | 2476 | 1856 | 620 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 53 න් 43 ක්ම පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය පහත වැටීමට හේතු වී තිබුණි.

(ආ) අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නීති නිලධාරි, අධ්‍යක්ෂ තනතුරු 8 ක්, කාර්මික නිලධාරි 16 ක් සැලසුම් ශිල්පි 01 ක් හා පුරාවිද්‍යා ප්‍රතිරූපන ශිල්පි 8 ක් පුරප්පාඩුව පවතින අතර මෙම තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීමට ඉල්ලීම් කර තිබුණද, අනුමැතිය ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් මෙම තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(ඇ) සංවර්ධන නිලධාරි 62, පුස්තකාලාධිපති තනතුරු 01 ක් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 11 ක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර තනතුරු 12 ක්ද 2015 වර්ෂයට පෙර සිට පුරප්පාඩුව පවතින අතර ඒවා පුරවන ලෙස 2015 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දන්වා තිබුණද පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 මාර්තු 18 දින වන විට කාර්මික සහකාර තනතුරු 75 ක් අනුමත වී තිබුණ ද, 2017 වර්ෂයේ ඔක්තෝබර් මස අවසන් වන විටද බඳවා ගැනීමේ මූලික කටයුතු පවා ආරම්භ කර නොතිබුණි.

(ඉ) කැණීම් හා කෞතුකාගාර ශිල්පී තනතුරු 30ක්, සංරක්ෂණ ශිල්පී තනතුරු 07ක්, ශිලා ලේඛන එකතු කරන්නා තනතුරු 02ක්, පෙදරේරු 29 ක්, වඩු කාර්මික තනතුරු 04 ක්, සැලසුම් මුද්‍රණකරු තනතුරු 01ක්, බංගලා භාරකරු තනතුරු 03 ක් සහ ප්‍රධාන රැකවල්කරු තනතුරු 05 ක් සඳහා බඳවා ගැනීමට 2016 දෙසැම්බර් 09 දින අනුමැතිය ලැබී තිබූ අතර 2017 නොවැම්බර් 23 දින වන විට මූලික කාර්යයන් ඉටු කරමින් පවතින බව දැනුම් දී තිබුණ ද මෙතෙක් බඳවාගෙන නොතිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුගත තනතුරු වන නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුරු (SL-1) සඳහා සීමිත තරඟයක් පැවැත්වීමට කටයුතු යොදා තිබියදි දෙපාර්තමේන්තුවේ MN – 04 සේවා ගණයට අයත් නිලධාරීන් පිරිසක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පැවරීම නිසා දින නියමයන් නොමැතිව විභාගය කල් දැමීමට සිදුව තිබුණි.